ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ ("සමාගම") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරු වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කරනු ඇතැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා වූ විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරිමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි සමාගමේ ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා වූ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සමාගම සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.5.1 ලැබිය යුතු දෑ

	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
(i.)	2016 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් සේවා ව්‍යාපෘතිය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ප්‍රධාන කළමනාකරු ලෙස සමාගම පත් කිරීමට අදාළව මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුළු ශේෂය වන රු. 246,939,587 න් සියයට 36කට සමාන රු.88,939,587 ක මුදලක් 2016 වසරේ සිට අයකර ගැනීමකින් තොරව ශේෂව පවතී.	ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම ශේෂය අයකර ගැනීම සඳහා එහි හැකි මට්ටමින් සෑම ක්‍රියාමාර්ගයක්ම ගෙන ඇත. සියලුම උපකාරක ලියකියවිලි සහිත නවතම ලිපිය 2025.01.08 දින මුදල් අමාත්‍යාංශයට යවා ඇති අතර එය මේ සමඟ අමුණා ඇත (ඇමුණුම II). වගකිවයුතු නිළධාරියා - ගණකාධිකාරී	තවදුරටත් ප්‍රමාදයකින් තොරව හිඟ මුදල අයකර ගැනීමට සමාගම අවශ්‍ය සියලු පියවර ගත යුතුය.
(ii.)	ආදායම් බදු වැඩිපුර ගෙවීම හේතුවෙන් රු.67,401,151 ක ආදායම් බදු ලැබිය යුතු ශේෂයක් 2014 වර්ෂයේ සිට හිඟව පවතී.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ පැවැත්වෙන සාකච්ඡාවට අනුව, වැඩිපුර ගෙවීම සඳහා අවශ්‍ය ගැලපීම් සිදු කරනු ලැබේ. වගකිවයුතු නිළධාරියා - ගණකාධිකාරී	හිඟ මුදල ලබා ගැනීමට සමාගම අවශ්‍ය පියවර ගත යුතුය.

1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති රීති, රෙගුලාසි ආදියට යොමුව		අනුකූල නොවීම	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (පාරිභෝගික නිසි සැලකිල්ල) රීතිවල 17 වන රීතිය	සෑම මූල්‍ය ආයතනයක්ම, පනතේ සහ මෙම රීතිවල අවශ්‍යතාවයන්ට මූල්‍ය ආයතනයේ අනුකූලතාවය සහතික කිරීම සඳහා වගකිව යුතු අනුකූලතා නිලධාරියෙකු ලෙස ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිලධාරියෙකු පත් කළ යුතු වුවද, ඉහත අවශ්‍යතා සපුරාලන අනුකූලතා නිලධාරියෙකු පත් කිරීමට සමාගම අපොහොසත් වී තිබුණි.	වත්මන් අනුකූලතා නිලධාරිනිය 2022.11.02 දින සිට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ විධායක කාර්යයක් සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයකු ලෙස එම තනතුරේ කටයුතු කරයි. තනතුරේ අඛණ්ඩ පැවැත්ම සඳහා ඇයගේ යෝග්‍යතාවය සහ හිමිකම වාර්ෂිකව CBSL වෙත ඉදිරිපත් කරනු ලැබේ. මෙම කරුණ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කර ඇති අතර, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අනුකූලතා අංශයේ සුදුසු නිලධාරියෙකු නිර්දේශ කර ඇත. සුදුසු නිලධාරියෙකු පත් කරන තුරු, දැනට සිටින නිලධාරියා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ අනුකූලතා නිලධාරියා ලෙස රාජකාරි ආවරණය කරනු ඇත. වගකිවයුතු නිළධාරියා/ කමිටුව - මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව	පනත සහ අදාළ නීතිරීති යටතේ නියම කර ඇති අවශ්‍යතා සපුරාලන අනුකූලතා නිලධාරියෙකු පත් කිරීම සමාගම කඩිනම් කිරීමට නිර්දේශ කෙරේ.
(ii)	2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 14(1)(b)(iv) වගන්තිය	සැක සහිත ගනුදෙනු හෝ ව්‍යාපාරික ක්‍රියාකාරකම් හඳුනාගෙන වාර්තා කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් හෝ ක්‍රියා පරිපාටි සහිත පද්ධතියක් සමාගම විසින් ස්ථාපිත කර හෝ පවත්වා ගෙන ගොස් නොතිබුණි.	ඇතුළත් වීමේදී පාරිභෝගික පරීක්ෂාව පහසු කිරීම, පවතින පාරිභෝගික පදනමේ කාලානුරූප පරීක්ෂණ පැවැත්වීම සහ එක් එක් ආයෝජනය සඳහා අරමුදල් මූලාශ්‍රය සත්‍යාපනය කිරීමෙන් ගනුදෙනුකරුවන් අඛණ්ඩව නිරීක්ෂණය කිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම UNSCR Screening Solution (කොම්පාස් පද්ධතිය) වෙත ප්‍රවේශය ලබාගෙන ඇත. ඊට අමතරව, මුදල් විශුද්ධිකරණ විරෝධී ප්‍රතිපත්තියේ සැක සහිත ගනුදෙනු වාර්තා කිරීමේ ක්‍රියාපටිපාටියක් විස්තර කර ඇති අතර ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය	සැක සහිත ගනුදෙනු හඳුනා ගැනීම සඳහා සමාගම සුදුසු ස්වයංක්‍රීය පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය.

			අවසන් වන තෙක් මුදල් විශුද්ධිකරණ විරෝධී පද්ධතියක් අත්පත් කර ගැනීම කල් දමා ඇත. කරුණාකර ඇමුණුම IV හි අමුණා ඇති මණ්ඩල වාර්තාව බලන්න. සැක සහිත ගනුදෙනු වාර්තා කිරීම් පටිගත කිරීම් සඳහා සහාය වීම සඳහා සැක සහිත ගනුදෙනු වාර්තා කිරීමේ ලේඛනයක් අඛණ්ඩ නඩත්තුව. වගකිවයුතු නිළධාරියා - අනුකූලතා නිලධාරියා	
(iii)	මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ (AML & CFT) ප්‍රතිපත්තියේ 08 වන වගන්තිය	අඩු, මධ්‍යම සහ ඉහළ ලෙස වර්ගීකරණය කරන ලද ගනුදෙනුකරුවන්ගේ අවදානම් තත්ත්වය පිළිවෙලින් සෑම වසර තුනකට වරක්, සෑම වසර දෙකකට වරක් සහ අඛණ්ඩ පදනමක් මත ඇගයීමට සහ යාවත්කාලීන කිරීමට ලක් කර නොතිබුණි.	සෑම මසකම අනුකූලතා නිලධාරියා ඉහළ අවදානම් සහිත ගනුදෙනුකරුවන්ගේ තත්ත්වය සමාලෝචනය කරයි. වාර්ෂිකව ML/TF අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස සියලුම ඉහළ, මධ්‍යම සහ අඩු අවදානම් සහිත ගනුදෙනුකරුවන් සඳහා වාර්ෂික විශ්ලේෂණයක් පවත්වනු ලැබේ. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ මුදල් විශුද්ධිකරණ විරෝධී ප්‍රතිපත්තියට අනුකූලව, මධ්‍යම සහ අඩු අවදානම් සහිත ගනුදෙනුකරුවන්ගේ අවදානම් ශ්‍රේණිගත කිරීම් දැනට තවදුරටත් සමාලෝචනයට ලක්ව ඇති අතර 2025.09.30 දින හෝ ඊට පෙර අනුකූල වනු ඇත. කරුණාකර 2024 වර්ෂය සඳහා ඇමුණුම V - ML/TF තක්සේරු වාර්තාව බලන්න. වගකිවයුතු නිළධාරියා - අනුකූලතා නිලධාරියා	අදාළ රෙගුලාසිවලට අනුකූලව සමාගම ගනුදෙනුකරුවන්ගේ අවදානම් තත්ත්වය තක්සේරු කළ යුතුය.

1.7 තොරතුරු තාක්ෂණ පොදු පාලන

	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාගම දැනට එහි උපස්ථ ක්‍රියාපරිපාටිය ස්වයංක්‍රීය නොවන ක්‍රමයට සිදු කරයි. එබැවින්, ස්වයංක්‍රීය උපස්ථ පද්ධතියක් නොමැතිකම දත්ත නිරවද්‍යතාවයේ ඉහළ	UAT දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අතර 2025.07.31 වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. වගකිවයුතු නිලධාරී - කළමනාකරු තොරතුරු තාක්ෂණ	මානව දෝෂ අවදානම අවම කිරීම, දත්ත අඛණ්ඩතාව වැඩි දියුණු කිරීම සහ අසාර්ථකත්වයන්

	අවදානමක් ඇති කරන මානව දෝෂ සහ විභව ප්‍රතිසාධන ගැටළු ඇතිවීමේ ඉහළ සම්භාවිතාවක් ඇති කරනු ලැබේ.		හෝ වෙනත් අනපේක්ෂිත සිදුවීම් වලදී කාලෝචිත හා විශ්වාසදායක දත්ත ප්‍රතිසාධනය සහතික කිරීම සඳහා සමාගමේ උපස්ථ ක්‍රියාපරිපාටිය ස්වයංක්‍රීය කළ යුතුය.
(ii)	සමාගමේ Efixin පද්ධතිය SWIFT පද්ධතිය සමඟ ඒකාබද්ධ කර නොමැති බැවින්, සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය ක්‍රියාවලියක් නොමැතිකම හේතුවෙන් SWIFT පද්ධතියට වැරදි පණිවිඩ ඇතුළත් කිරීමේ ඉහළ හැකියාවක් පවතී.	පවතින පද්ධතියේ අඩුපාඩු සපුරාලීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම එහි පවතින පද්ධතිය වැඩිදියුණු කරමින් සිටී. භාණ්ඩාගාර බිල්පත්, බැඳුම්කර සහ ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු ගනුදෙනුකරුවන් සඳහා Swift පණිවුඩ ස්වයංක්‍රීයකරණය දැනටමත් අවසන් කර ඇත. ප්‍රතිලෝම ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු ස්වයංක්‍රීය කිරීම, ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු සඳහා සුරැකුම්පත් ආපසු කැඳවීම සහ ප්‍රතිස්ථාපනය කිරීම සහ සම්පූර්ණ ගනුදෙනු පවතින පද්ධතිය සමඟ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියක පවතී. මෙම පණිවුඩ ස්වයංක්‍රීයකරණය 2025.08.31 වන විට අවසන් වනු ඇත. වගකිවයුතු නිලධාරී - කළමනාකරු තොරතුරු තාක්ෂණ	සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය පද්ධතියක් නොමැතිකමේ අවාසි වළක්වා ගැනීම සඳහා ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලිය කඩිනම් කිරීම නිර්දේශ කෙරේ.
(iii)	2024 අප්‍රේල් 29 වන දින මණ්ඩලය විසින් අනුමත කරන ලද තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුවේ සංශෝධිත යොමු නියමයන් (TOR) අනුව තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව කාර්තුමය වශයෙන් රැස්විය යුතු වුවද, 2024 වර්ෂය තුළ පවත්වා ඇත්තේ එක් රැස්වීමක් පමණි.	එකඟවේ. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම යනු ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පූර්ණ අනුබද්ධිත ආයතනයක් වන අතර එය ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඩොමේන් පහසුකම යටතේ ක්‍රියාත්මක වේ. මේ හේතුව නිසා, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තොරතුරු තාක්ෂණ අංශයේ නියෝජිතයින් දෙදෙනෙකු ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුවට ඇතුළත් කර ඇත. කෙසේ වෙතත්, ජාතික ඉතිරිකිරීමේ බැංකුව ඔවුන්ගේ හර බැංකු පද්ධතිය සංක්‍රමණය කිරීම හේතුවෙන්, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ නියෝජිතයින්ට තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුවේ රැස්වීම් සඳහා සහභාගී වීමට නොහැකි විය. මෙම යැපීම ඉවත් කිරීම සඳහා, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම විසින් තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුවේ යොමු නියමයන් යාවත්කාලීන	සමාගම විසින් අදාළ රැස්වීම් කාර්තුමය පදනමක් මත, යොමු නියමයන්ට (TOR) අනුකූලව කැඳවිය යුතුය.

කරන ලද අතර, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තොරතුරු තාක්ෂණ නියෝජිතයින්ගේ අනිවාර්ය සහභාගීත්වය සංශෝධනය කර "ආරාධනා මගින් නියෝජනය" ඉදිරිපත් කරන ලදී. 2025 වසරේ මේ දක්වා 2025.02.06 සහ 2025.06.23 යන දිනවල රැස්වීම් දෙකක් පවත්වා ඇත. තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුවේ නියමයන්ට අනුකූලව, ඉතිරි රැස්වීම් දෙක 2025 දී පැවැත්වීමට අපි සැලසුම් කරමු. කරුණාකර ඇමුණුම VI- තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුවේ රැස්වීම් ප්‍රඥප්තිය බලන්න.

වගකිවයුතු නිලධාරී - කළමනාකරු තොරතුරු තාක්ෂණ

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 958,175,255 ක ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ එයට අනුරූප ලාභය රු. 1,641,605,934 ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු. 683,430,679 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පෙර වසරට සාපේක්ෂව පොළී ආදායම රු. 780,095,266 කින් වැඩි වුවද, මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම් ගැලපීමෙන් හඳුනාගත් ශුද්ධ ලාභය රු. 1,395,730,084 කින් අඩු වීම පිරිහීමට හේතු විය.

2.2 ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමයන් ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය පිළිබඳ විශ්ලේෂණය පහත දක්වා ඇති පරිදි වේ;

විස්තර	විචලනය - හිතකර/ (අහිතකර) (රු.)	විචලනය (%)	විචලනය සඳහා හේතු
පොළී ආදායම	615,634,818	20%	ආයෝජන කළඹේ වැඩිවීම.
ශුද්ධ පොළී ආදායම	254,633,925	26%	ආයෝජන කළඹ වැඩිවීම නිසා පොළී ආදායමේ වැඩිවීම.
ගාස්තු සහ කොමිස් ආදායම	(6,298,600)	(45%)	පාරිභෝගික වෙන්දේසි ලංසු වලින් ගාස්තු ආදායම අඩුවීම සහ සමහර භාරකාර ක්‍රියාකාරකම් අවසන් වීම හේතුවීම
ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය උපකරණවලින් ලද	(1,395,730,084)	(61%)	2023 වසර අවසානයේ සියයට 13.6 සිට 2024 වසර වන විට සියයට 9.91 දක්වා වෙළඳ කළඹේ සාමාන්‍ය වෙළඳපොළ

ශුද්ධ වෙළඳ ලාභය/ (පාඩුව).			අනුපාත පහත වැටීම හේතුවෙන් උපලබ්ධි නොවූ ලාභයේ අඩුවීම.
පුද්ගල පිරිවැය	35,692,667	51%	නව ප්‍රසාද දීමනා ප්‍රතිපත්තියට අනුව වැටුප් සංශෝධනයෙන් වැටුප් වර්ධකයක් සහ මාස 05 ක කාර්ය සාධන ප්‍රසාද දීමනාවක් ලබාදීම.
වෙනත් වියදම්	64,975,763	111%	භාණ්ඩාගාර පද්ධතිය සඳහා රු. මිලියන 53 ක ප්‍රතිපාදනයක් සිදු කිරීම හේතුවෙන් සහ තැරැව්කාර වියදම් සහ වාර්ෂික සාමාජික ගාස්තුව වැඩිවීම.

2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

විස්තරය	**වර්ෂය**	
	2024	**2023**
හිමිකම් මත ප්‍රතිලාභ (%)	15.97	29.8
වත්කම් මත ප්‍රතිලාභ (%)	5.39	9.7
අවදානම් මත බර තබන ලද ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය – (අවම අවශ්‍යතාවය - 10%)	27.6	21.3

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අනාර්ථික ගනුදෙනු

විගණන නිරීක්ෂණය	**කළමනාකරණයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
2020 මාර්තු මස අවසානය වන විට නව භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා සමාගම ඉන්දියාවේ Credence Analytics Company සමඟ ගිවිසුමකට එළඹ ඇති අතර දැනටමත් ඇමරිකානු ඩොලර් 267,131 ක අත්තිකාරම් ගෙවීමක් කර ඇති අතර එය රු.53,833,248 ට සමාන වේ. කෙසේවෙතත්, අවශ්‍ය සේවාවන් සැපයීමේදී සැපයුම්කරු විසින් සිදු කරන ලද ප්‍රමාදයන් හේතුවෙන් ගිවිසුම අවසන්	ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ නීති අංශයෙන් නීති උපදෙස් ලබා ගැනීමට උපදෙස් ලබා දී තිබුණි. මණ්ඩලයේ උපදෙස් පරිදි, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම විසින් මෙම කාරණය ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ නීති අංශය වෙත යොමු කරන ලදී. මෙම	සමාගම විසින් සැපයුම්කරුගෙන් පාඩු අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.

කිරීමට සහ පවතින පද්ධතිය වැඩිදියුණු කිරීමට සමාගමේ අධ්‍යක්ෂ තීරණය කර තිබුණි. රු.53,833,248 ක මුදල දැනටමත් ගෙවා ඇති අතර එය ආර්ථිකමය නොවන වියදමක් ලෙස නිරීක්ෂණය විය. මෙම මුදල අයකර ගැනීම සඳහා සමාගම විසින් මෙතෙක් කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ආරම්භ කර නො තිබුණි.	කාරණය සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ නීති අංශය නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත, Credence Analytics Company ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග සඳහා ප්‍රමාණාත්මක උල්ලංඝනයන් පිළිබඳ විස්තර ඉදිරිපත් කරන ලදී. වගකිවයුතු නිලධාරී - කළමනාකරු තොරතුරු තාක්ෂණ	

3.2 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
2015/16 තක්සේරු වර්ෂය සඳහා උපයන විට ගෙවීමේ බද්ද ප්‍රමාද වීම හේතුවෙන් සමාගම රු.467,612 ක දඩ මුදලක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීමට සිදුව පවතී.	2015/2016 (2015 අප්‍රේල් සිට 2016 මාර්තු දක්වා) කාලය සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ඔවුන්ගේ TIN අංක 409046266 යටතේ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ වෘත්තීය දීමනාව සඳහා උපයන විට ගෙවීම ගෙවා ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් සමාගම වෙනම TIN අංකයක් යටතේ ලියාපදිංචි කර ඇති බැවින්, වෘත්තීය දීමනාව සඳහා උපයන විට ගෙවීමේ බද්ද ගෙවීම 2016 අප්‍රේල් මාසයේ සිට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම විසින් ගෙවනු ලැබේ. කරුණාකර ඇමුණුම VIII බලන්න – ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් සමාගම වෙතින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද ලිපිය. වගකිවයුතු නිලධාරී - ගණකාධිකාරී	සමාගම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ගැටලුව විසඳා ගත යුතුය.

3.3 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා ආසන්නතම සුදුසුකම් ලත් අනුප්‍රාප්තිකයෙකු පත් කර රඳවා ගැනීමට සමාගම අපොහොසත් වී ඇති අතර, එම තනතුර සඳහා සුදුසු පුද්ගලයෙකු ආකර්ෂණය කර ගැනීමට සහ තෝරා ගැනීමට සමාගමට ඇති	ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා අනුප්‍රාප්තිකයා ලෙස ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකු (ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙතින් ද්විතීයික) දැනට සිටී. වගකිවයුතු කමිටුව -BHRCC/	සමාගම දීර්ඝ කාලයක් සඳහා විධායක නිලධාරීන් ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට පියවර ගත යුතුය.

	නොහැකියාව හේතුවෙන් ප්‍රධාන කළමනාකරු තනතුර අඛණ්ඩව පුරප්පාඩු වී ඇති බව නිරීක්ෂණය විය.	අධ්‍යක්ෂ මණ්ඩලය	
(ii)	සමාගම විසින් වසර 8 කට වැඩි කාලයක් රැකියා විරහිතව සිටි 2016 ට පෙර අදාළ විගණන අත්දැකීම් ලබා ඇති අභ්‍යන්තර විගණන නිලධාරියෙකු බඳවා ගෙන තිබුණි. අභ්‍යන්තර විගණන කාර්යය, සමාගමක ශක්තිමත් අභ්‍යන්තර පාලනයන්, ඵලදායී අවදානම් කළමනාකරණය සහ යහපත් ආයතනික පාලනය සහතික කිරීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. එබැවින්, දිගුකාලීන වෘත්තීය පරතරයකින් සහ මෑත කාලීන වෘත්තීයමය නියැලීමක් නොමැතිකමකින් පසු එවැනි ප්‍රධාන තනතුරකට අපේක්ෂකයෙකු පත් කිරීම, සමාගමේ අපේක්ෂිත කාර්ය සාධන මට්ටමට අහිතකර ලෙස බලපෑ හැකිය. තවද, සමාගමේ අවධානයට ලක් කර ඇති පෙර විගණනවලදී ද සමාන බඳවා ගැනීමේ ප්‍රවේශයන් නිරීක්ෂණය වී ඇත.	වර්තමානයේ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ අභ්‍යන්තර විගණන බාහිර පාර්ශවය විසින් සිදු කරනු ලබන අතර අභ්‍යන්තර පාලනය සහ අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, සමාගම ආයෝජන සහකාර III ශ්‍රේණියට අභ්‍යන්තර විගණන නිලධාරියෙකු බඳවා ගෙන ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව අභ්‍යන්තර විගණන නිලධාරියෙකු බඳවා ගෙන ඇත. අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත් කිරීම මාස හයක කොන්ත්‍රාත් කාලයකට යටත් වේ. අභ්‍යන්තර විගණන නිලධාරියා මණ්ඩල විගණන කමිටුව වෙත වාර්තා කරනු ඇත. අපේක්ෂිත කාර්ය සාධන මට්ටම සමාගමේ අපේක්ෂාවන්ට සමාන නොවේ නම්, රැකියාව දිගටම කරගෙන යාම මණ්ඩල විගණන කමිටුව විසින් තීරණය කරනු ලැබේ. වගකිවයුතු කමිටුව - මණ්ඩල විගණන කමිටුව/ BHRCC	පුළුල් ආරම්භක පුහුණුවක්, අධික පිරිවැයක් අවශ්‍ය සහ ප්‍රාථමික ගනුදෙනු මෙහෙයුම් වැනි විශේෂිත ක්ෂේත්‍රවලට අනුවර්තනය වීමට සැලකිය යුතු කාලයක් ගතවන සේවකයින් බඳවා ගැනීමේදී සමාගම වඩාත් සැලකිලිමත් විය යුතුය. එසේම, සමාගම විසින් දැනට සිටින සේවකයින්ගේ නිපුණතා වැඩි දියුණු කිරීම සහ මෙම විශේෂිත ක්ෂේත්‍රවල මෙහෙයුම් කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා ව්‍යුහගත පුහුණු වැඩසටහන් සඳහා ඇතුළත් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, 2019 වර්ෂයේදී පාරිභෝගික පහසුව සඳහා ජංගම යෙදුමක් හඳුන්වා දීමට සමාගම සැලසුම් කර තිබුණද, 2025 මැයි 31 විගණන දිනය වන විටත් එය ක්‍රියාත්මක කර නොතිබුණි.	ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම එහි අභ්‍යන්තර භාණ්ඩාගාර පද්ධතිය සහ පාරිභෝගික කළමනාකරණ පද්ධතිය (CMS) වැඩිදියුණු කරමින් සිටී. වැඩිදියුණු කිරීම අවසන් වූ පසු, 2026.03.31 දින හෝ ඊට පෙර ජංගම යෙදුම හඳුන්වා දීමට පියවර ගනු ලැබේ. වගකිවයුතු නිලධාරී - කළමනාකරු තොරතුරු තාක්ෂණ	යෝජිත වැඩසටහන් කාලෝචිත ලෙස ක්‍රියාත්මක කළ යුතුය.

4.2 විගණන කමිටුව

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
බාහිරින් ලබාගත් අභ්‍යන්තර විගණකවරයා මාසිකව අභ්‍යන්තර විගණන පවත්වන බවට එකඟ වී තිබුණද, වාර්තා නිතිපතා ඉදිරිපත් කර නොතිබුණි. විශේෂයෙන්, 2024 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා මාස සඳහා වූ විගණන වාර්තා 2025 ජුනි 13 වන දින මණ්ඩල විගණන කමිටුවට ඉදිරිපත් කරන ලද අතර, ඒවායේ අදාළ විභාග කාල සීමාවන්ගෙන් සැලකිය යුතු ප්‍රමාදයන් සිදුවිය.	ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම විසින් 2025.06.16 දින මණ්ඩල විගණන කමිටු රැස්වීමක් පවත්වා 2024 දෙසැම්බර් දක්වා අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කරන ලදී. තවද, 2025 මැයි දක්වා අභ්‍යන්තර විගණන වාර්තා කළමනාකාරිත්වය විසින් සමාලෝචනය කර අභ්‍යන්තර විගණක (E & Y) වෙත ඉදිරිපත් කරන ලදී. වගකිවයුතු නිලධාරී - අභ්‍යන්තර විගණක	බාහිරින් ලබාගත් සේවා සපයන්නාගෙන් අභ්‍යන්තර විගණන වාර්තා කාලෝචිත ආකාරයකින් ලබා ගැනීමට සමාගම අවශ්‍ය පියවර ගත යුතුය.